


සිසිර දිසානායක

# ප්‍රථම හෙළ බොදු ගී දෘෂ්‍ය තැටිය "සම්මා ගී සර" වික්ටර් රත්නායකයන් ගෙන් !

මව් බිමේ සිටින අපගේ කලාකරුවන් අතරින් නිතරම කාර්ය බහුලව සිටිනා කලාකරුවෙකි වික්ටර් රත්නායකයන්. කිසියම් හෝ නිර්මාණ කටයුත්තක, නිර්මාණ එකතුවක, එසේත් නැත්නම් අදාල උත්සව සභාවක කිසියම් හෝ කටයුත්තක නියැලී සිටිනා කලාකරුවෙකි රත්නායකයන්. විටින් විට රත්නායකයන් ගේ නිර්මාණ එළිදැක්වීම් පිළිබඳව අප හට අසන්නට ලැබෙන්නේ ඒ නිසා-වෙනි.

2600 වන සම්බුද්ධ ජයන්තිය සමයේ අසන්නට ලැබුණු එවන් ආරන්චියකට අනුව "ගී සඳළුව" පාඨකයින් වෙනුවෙන් වික්ටර් රත්නායකයන්ව දුරකථනයෙන් සම්බන්ධ කරගැනීමට උත්සුක වුයෙමු අපි.

"ඔව් සිසිර, ජුනි අටවෙනිද මගේ බෞද්ධ ගීත ඩී.වී.ඩී. එක එළිදක්වනවානේ........." රත්නායකයන් අප ඇසූ ආරංචිය සනාථ කළේය. හෙළ ගීත කෙතේ වැඩිම බොදු ගී ප්‍රමාණයක් වැපිරූ ගායන ශිල්පියා ලෙස රත්නායකයන් නම් කිරීමේ වරදක් නැතැයි අපි හඟින්නෙමු. පසු ගිය කාලයේ "සමිඳු පාමුල" නමින් බොදු ගීත ඇතුලත් සංගත තැටියක් රසිකයින්ට දයක කළ රත්නායකයන් මෙවර සැර-සෙන්නේ සිය බොදු ගී ඇතුලත් ඩිජිටල් දෘෂ්‍ය තැටියක් එළිදැක්වීමටයි.

"ඩී.වී.ඩී. එක "සම්මා ගී සර" නමිනුයි අපි නම් එකතුවේ එනවා......" වික්ටර් රත්නායකයන් ගුවන් විදුලි වැඩසටහනක් සඳහා මුලින්ම ගායනා කළේ ද බොදු ගීයක්. එහි ගේය පද රචකයා වුයේත් අද අප අතර සිටිනා ජ්‍යෙෂ්ඨතම ගේය පද රචකයාණන් යැයි සැළකිය හැකි අරිසෙන් අහුබ-දුවන් මයි. ඒ "සිඳ බිඳ මොහඳුරු පාප" ගීයයි.

"මේ ඩී.වී.ඩී. එකට ප්‍රකාශ දෙකකුත් ඇතුලත්



කළේ. ඇත්තටම සිංහල බෞද්ධ ස්වතන්ත්‍ර ගීත ඇතුලත් දෘෂ්‍ය තැටියක් එළිදක්වන පළවෙනි වතාවයි මේ. ඒ අතින් මම හරි වාසනාවන්තයි කියලා හිතනවා මේ වගේ බුද්ධ ජයන්තිට සමරන වෙලාවක මේ වාගේ හොඳ දේකට යොමු වෙන්න ලැබුණ හන්ද......."

"ඒ වගේම මේ ස්වතන්ත්‍ර බෞද්ධ ගීත එකතුවේ එක ගීතයක් හැරෙන්න අනික් සියළුම ගීතවල තනු හා සංගීත නිර්මාණ මගේමයි. "කලා වැවේ දියගැඹරේ" ගීතයේ තනුවයි සංගීතයයි වාද්‍ය විශාරද ඩී. ආර්. පිරිස් මහත්මයාගේ"

"පද රචනය පැත්තෙන් වැඩිම දයකත්වය ප්‍රේමකීර්තිගෙන් ......" රත්නායකයන් හා යාව ජීව ව ගී නිර්මාණකරණයේ ගැලී සිටි දිවංගත ප්‍රේමකීර්ති ද අල්විස් ප්‍රවීණ ගේය පද නිබන්ධකයානන් රත්නායකයන් හඳුන්වන්නේ "ප්‍රේම්" නමින්.

"ඊට අමතරව කලාශූරී අරිසෙන් අහුබුදු, අධිනීතීඥ ඩබ්ලිව්. අබේසිංහ, මහාචාර්ය තිලක් රත්නකාර වගේ ප්‍රවීණයන්ගේ බෞද්ධ ගී පද රචනා "සම්මා ගී සර" ට එකතු වෙනවා. විමල් රූබසිංහ පද රචකයාගේ අළුත්ම බෞද්ධ ගීතයකුත් මේ වෙනවා. සිංහල පුර්විකාව කරන්නේ අද ලංකාවේ සැදැහැවත් අය කවුරුත් දන්න මාවරලේ බද්දිය ස්වාමීන් වහන්සේ, ඉංග්‍රීසි ප්‍රකාශය සඳමාලි හේ-වනායක මාධ්‍යවේදිනියගේ".

"දෘෂ්‍ය තැටියක් නිසා ගැලපෙන දර්ශන තල ගැනත් බලන්න එපැයැ. ඉතින් මේ ගීත වලට ගැලපෙන්න කැළණි රජමහා විහාරය, අනුරාධපුර අටමස්ථාන, පොළොන්නරුවේ ගල් විහාරය, ගෙඩිගේ, වටදා ගේ, හුණුපිටියේ ගංගාරාමය, අව්කන වගේ තැන්වල දර්ශන තලවල රූප ගත කළා." සාර්ථකව යමක් නිම කිරීමේ උද්දාමය රත්නායකයන්ගේ ස්වරයෙහි ගැබ් වී ඇති සේ හැඟෙයි.

ජුනි අට වනදා මෙම ගීත එකතුව එළිදැක්වෙන උත්සවය පිළිබඳවයි අප අනතුරුව යොමු වුයේ.

"මහනුවර ශ්‍රී දළදා මාළිගයේ මහමළු වේදියි මේ කටයුත්ත කෙරෙන්නේ. භික්ෂු දේශනය කෝට්ටේ නාග විහාරාධිපති තැන්පත් පුජ්‍ය මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ විසින් කරන්නයි නියමිත වෙලා තියෙන්නෙ. ගිහි දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිංහල හා සංස්කෘතික අංශයාධිපති ආචාර්ය සමන්චන්ද්‍ර රණසිංහ මහත්මයාටයි භාර වෙලා තියෙන්නේ...." උත්සවයේ ගාම්භීර බව රත්නායකයන්ගේ හඬෙහි ද ගැබ් ව ඇති සේ දැනෙයි.

"අපි මේ ගීත එකතුව පිළිගන්වන්නට බලාපොරොත්තු වෙන්නේ ශ්‍රී දළදා මාළිගාවේ දියවඩනේ නිළමේ තැන්පත් ප්‍රදීප් නිලංග දෑල මහත්මයාට" කඩුගන්නාව ප්‍රදේශයේ ඉපිද, හැඩී " වැඩී කෙෂ්ත්‍රයට අවතීර්ණ වු වික්ටර් රත්නායකයන-"ට මහනුවර ප්‍රදේශයට පමණක් නොව මුළු මහත් ශ්‍රී ලංකාවටම වැදගත් වන මෙවන් ගෞරවනීය ස්ථානයක මෙවන් ගෞරවනීය සුභ කටයුත්තක් කිරීමට ලැබීම උරුමයෙන් ම ලද වාසනා ගුණයක් දෝ යි සිතෙයි.

"එදා ට වසන්ත රෝහණ මාධ්‍යවේදියායා, සඳමාලි හේවානායක මාධ්‍යවේදිනි යයි උත්සව සභාව නිවේදක කටයුතු කරමින් මෙහෙයවන්න සුදුසු අය විදියට අපි තීරණය කළා." රත්නායකයෝ පිළිසඳර නිමා කළහ.

මෙවන් සරු දේ, ගරු කටයුතු දේ තව තවත් මව් බිමට, මව් බිමේ රසිකයින්ට දයක කරන්නට අවශ්‍ය නීරෝගී සුව, දිර්ඝායුෂ, ධෛර්ය, ශක්තිය වික්ටර් රත්නායකයන්ට තව තවත් ලැබේවා ! යි යන්න අප "ගී සඳළුව" පාඨකයින් වෙනුවෙන් මේ මොහොතේ කරනා ප්‍රාර්ථනයයි !

ප්‍රේමකීර්ති ද අලිවිස් නිබන්ධකයාණන් රචනා කළ රත්නායකයන් සංගීතවත් කොට ගැයූ "නිවන් දුටු හිමි" ගීතයේ පද පෙළ "ගී සඳළුව" සඳහා "සම්මා ගී සර" ගී එකතුවෙන් ඉදිරිපත් කරන්නෙමු. විහාර ගෙයක ගාථා කියවීමේ දී ඇතිවන ශාන්ත රසය, දේංකාරය, පිරිතක ඇති ගායනීය ගුණය සිය හඬින්, සංගීතයෙන් මතු නොව සමුහ ගායනාවන්ගෙන් ද ජනිත කරවන අගනා ප්‍රකට ගීයකි මෙම ගීය.

*නිවන් දුටු හිමි රුවන් පිළිරුව*
*පමණි මට අද ශේෂ වුයේ*
*හිමි දෙසු බණ අසා ඇති මුදු*
*ඇසුයේ හිමිගේ හඬින් නොව*
*අනේපිඩු සිටු පුතුට මෙන්*
*අනේ හිමියනි මට ද දැන්*
*දෙසා වදහළ මැනවි බුදු බණ*
*මහා කරුණාවෙන් !*

*ගලක් වී නම් මමත් ඉවසම්*
*යකුළු පහර ද කැපී වෙන් වෙන*
*ඔබේ පිළිරුව නිමකරන්නට*
*කලාකරුවකු අතින් ලැබෙනා*
*එයින් හිමි හුරු කළ වු*
*ශාන්තිය මට ලැබේවා !*

*මහා කරුණාවෙන් !*

*මලක් වන්නට නොහැක හිමියනි*
*මිනිස් බව ලැබ සිටින මා හට*
*මලක් අද ඔබ දෙපා පාමුල*
*විදින සිහිලස නොමැත මා හට*
*මලක් වු ද මගේ ජීවය*
*ඔබේ පා මුල පරවුණාවේ !*


පරිගණක අලුත්වැඩියාව
Professional Services
# Computer Repairs & Upgrades
# Virus Removals
# ADSL Professional installations
# Networking
# Brand New Computers for sales
# Laptop screen repairs
# Trouble shooting Browsing, E-mail & internet connection issues
# All Computer parts for low price
Jithendra Weerakoon
(IT Consultant)
02 Mosstrooper Court
Mill Park
Victoria, 3082
Australia
M: 0422 662 218
T: 03 9005 0893
E: jaytec@tpg.com.au
E: jith710@hotmail.com

YOUR TRUSTED PARTNER IN AUSTRALIAN MIGRATION
We provide a very professional, personalised and affordable service to all your Migration related needs...
WE OFFER VERY SPECIAL RATES FOR PROVISIONAL VISA HOLDERS & STUDENTS
We enrol international students to leading Australian educational institutions as well. Our services are entirely FREE for our prospective students.
DMS DESTINY MIGRATION SOLUTIONS
YOUR TRUSTED PARTNER IN AUSTRALIAN MIGRATION
AMILA WEERASINGHE
LL.B. Grad Cert Mig Law MMIA
Registered Migration Agent
MARN 1067683
DESTINY MIGRATION SOLUTIONS
21 McMaster Court Pakenham Victoria
T / F 03 5941 4042
Call 04 3009 0385
info@destinymigrations.com
www.destinymigrations.com
MIA Member of Migration Institute of Australia
Sri Lankan Office
Destiny Migration Solutions PVT Ltd
28 Jayanthi Mawatha Pamunuwa Road Maharagama
T / F 2841387 M 071 6161888